# <u>ශාස්ත්‍රපති උපාධි නිබන්ධ ලිවීම සඳහා අදාළ උපදෙස්</u>

## <u>වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය</u>

1. **<u>නිබන්ධිකාවේ මාතෘකාව ඇතුළත් පිටුව.</u>**

    1. උපාධියේ නම ( පිටුවේ මැද ඉහළින් ලිවිය යුතුය.) font: FM Abhaya, size 16
    2. නිබන්ධිකාවේ මාතෘකාව: font size 22
       අනුමාතෘකා තිබේ නම් font size 16 ප්‍රමාණයෙන් දක්වන්න.
    3. උපාධි අපේක්ෂකයාගේ සම්පූර්ණ නම: font size 16
    4. ඔබගේ පර්යේෂණ නිබන්ධිකාව හා සම්බන්ධ වන අධ්‍යයන අංශයේ සහ විශ්වවිද්‍යාලයේ නමඃ font size 14
    5. නිබන්ධිකාව බාරදෙන වර්ෂය සහ මාසයඃ font size 14
    6. ශිෂ්‍ය අංකයඃ font size 14

පහත සඳහන් උදාහරණය බලන්න.

| |
|---|
| වාග්විද්‍යා ශාස්ත්‍රපති උපාධිය<br><br>තරුණ වයසේ දරුවන්ගේ දෙවන භාෂා උපාර්ජනයට<br>ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන් පිළිබඳ වූ විශේෂ පර්යේෂණයකි.<br><br>කහව හේවගේ මානෙල් ජයතිලක<br><br>වාග්විද්‍යා අධ්‍යයන අංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය<br><br>2013 දෙසැම්බර්<br>ශිෂ්‍ය අංකය : ….. |

## 2. නිබන්ධිකාව පිළිබඳව අපේක්ෂකයාගේ ප්‍රකාශය :

කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අධ්‍යයන අංශයේ වාග්විද්‍යාව පිළිබඳ වූ ශාස්ත්‍රපති පාඨමාලාවේ ඒක දේශ අවශ්‍යතාවක් සපුරාලනු වස් ඉදිරිපත් කෙරන මෙම නිබන්ධිකාව මාගේ පර්යේෂණ කෘතියක් බවටත්, මෙහි ඇතුළත් තොරතුරු වෙනත් කෙනෙකු විසින් රචනා කරන ලද හෝ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලද කරුණු නොවන බවටත්, වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බවටත්, මාගේ දැනීමේ ප්‍රමාණයෙන් සහතික කොට මෙසේ ප්‍රකාශ කර සිටිමි.

අපේක්ෂකයාගේ නමඃ........(මුද්‍රිත අකුරින්)......

අත්සන ................................... දිනයඃ ....................

## 3 නිබන්ධ උපදේශකවරයාගේ ප්‍රකාශයඃ

මෙම නිබන්ධිකාව මා විසින් නිරීක්ෂණයට ලක් කරන ලද බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

උපදේශකවරයාගේ නම .... (මුද්‍රිත අකුරින්)......

අත්සන ........................... දිනයඃ ...........................

## 4. සාරසංග්‍රහයඃ

ඇතුළත් විය යුතු කරුණු

* නිබන්ධිකාවේ ඇතුළත් කරුණු පිළිබඳව කෙටි හැඳින්වීමක් සහ එහි අරමුණ
* අනුගමනය කරන ලද ක්‍රමවේදය.
* මූලික නිගමන සහ එහි වටිනාකම

වචන 250කට නොවැඩි විය යුතුය.

## 5 උපකාරානුස්මෘතිය

නිබන්ධිකාව සම්පාදනය කිරීමේදී උපකාරවූ සංවිධාන, ආයතන හෝ පුද්ගලයන්ට කෘතඥතාව පළකිරීම මෙහි දී අපේක්ෂිතය.

## 6 පටුන ඃ

නිබන්ධයේ අන්තර්ගත ප්‍රධාන මාතෘකා සියල්ල මෙහි ඇතුළත් කළ යුතුය. එය පරිච්ඡේද යටතේ එක් එක් පරිච්ඡේදයේ ඇතුළත් අනු මාතෘකා සඳහා ඇතුළත් අංකය සටහන් කරන්න.

| | |
|---|---|
| මාතෘකාව | පිටු අංකය |
| ප්‍රකාශනය | I |
| සාර සංග්‍රහය | II |
| උපකාරානුස්මෘතිය | III |
| පටුන | IV |
| වගු /ප්‍රස්ථාර | V |
| සංකේත/සූචිය | VI |
| 1 පරිච්ඡේදය | 1 |
| 2 පරිච්ඡේදය | 5 |

.
.
.

ආශ්‍රිත ග්‍රන්ථ
ඇමුණුම්

## 7 පරිච්ඡේද සැලැස්ම

1 පරිච්ඡේදය (පිටුව මැද) font size 14
මාතෘතාව (පිටුව මැද) font size 16

1 . 1 හැඳින්වීම
1 . 2 .........................
1 . 3 .........................
1-----
1- සාරාංශය
*පාදක සටහන්*

2 පරිච්ඡේදය (පිටුව මැද) font size 14
මාතෘතාව (පිටුව මැද) font size 16

2 . 1 හැඳින්වීම
2 . 2 .........................
-------
2 - සාරාංශය
*පාදක සටහන්*

3 පරිච්ඡේද (පිටුව මැද) font size 14
මාතෘතාව (පිටුව මැද) font size 16
3 . 1 හැඳින්වීම
3 . 2 .........................

3 ---- සාරාංශය
*පාදක සටහන්*

4 පරිච්ඡේද (පිටුව මැද) font size 14

මාතෘකාව  (පිටුව මැද) font size 16

4 . 1  හැඳින්වීම
4 . 2  ........................
4 --------
4--  සාරාංශය
*පාදක සටහන්*

5  පරිච්ඡේද (පිටුව මැද) font size 14
මාතෘකාව  (පිටුව මැද) font size 16

* සෑම පරිච්ඡෙදයක් ආරම්භයේදී ම අරිච්ඡෙද අංකය මුල් පිටුවෙහි ඉහල මැදින් සඳහන් කරන්න. (font size 14)
* පරිච්ඡෙදයේ දෙවන පෙලෙහි මධ්‍යයේ මාතෘකාව (font size 16) සඳහන් කරන්න.
4. පාදක සටහන් පරිච්ඡේද අවසාන සටහන් (වෙනත් කෘතීන් ආශ්‍රය කොට ගත් හෝ උපුටාගන්නා ලද සටහන්) පරිච්ඡෙද අවසානයෙහි කුඩා අකුරින් (ප්‍රමාණය 10) සටහන් කළ යුතුය.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ

## පහත දැක්වෙන සැලැස්මට අනුව හාවඩ් හෝ APA ක්‍රමයට ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය සකස් කළ යුතුය

පොත්, සඟරා සහ විද්‍යුත් ලිපි ලේඛන වෙන වෙනම අකාරාදී පිළිවෙලට සඳහන් කිරීම අවශ්‍යය.

- පොත්

**කතෘ නාමය** ඃ පෙළපත් නාමයට පසු මුලකුරු,(වරහන් තුළ වර්ෂය), පොතේ නම, නගරය හෝ රට, ප්‍රකාශක.
උදාඃ සිල්වා. පී. (2008), භාෂාව, ශ්‍රී ලංකා, වාග්විද්‍යා අධ්‍යයන අංශය.

* කතුවරු දෙදෙනෙකුගේ පොතක් වූ විට.

ඉහත පිළිවෙළට 1වෙනි සහ දෙවැනි කතුවරු(වර්ෂය) පොතේ නම, නගරය හෝ රට, ප්‍රකාශක . පිළිවෙළට යොදන්න.

* කතුවරු දෙදෙනෙකුට වඩා වැඩි වූ විට
ප්‍රධාන කතුවරයාගේ නමට පසු et al (වර්ෂය)පොතේ නම, නගරය හෝ රට, ප්‍රකාශක.
උදාඃ රණසිංහ. පී. et al (2008) ....................................

* සංස්කරණය කරන ලද පොතක එක් පරිච්ඡේදයක් පමණක් නම්,

කතුවරයාගේ නම (පෙර පරිදි),(වර්ෂය), මාතෘකාව, සංස්කරණය කරන ලද පොතේ නම, සංස්කාරකගේ නම/සංස්කාරකවරුන්ගේ නම් (වරහන් තුළ), පිටු අංක, ප්‍රකාශක, නගරය හා රට.

උදාහරණඃ සඟරා සම්බන්ධව,

කතෘ (වර්ෂය), ලිපියේ මාතෘකාව, සඟරාවේ නම, ප්‍රකාශක, කී වෙනි කලාපය ද යන වග.

උදා ඃ
පුවත් පත්

රචකයාගේ නම (වර්ෂය), ලිපියේ මාතෘකාව, පුවත්පත් නාමය, මාසය සහ දිනය, පිටු අංකය.

උදාඃ රණවීර පී.(2008), පාසැල් අධ්‍යාපනයේ ඇති ගැටලු, ලංකාදීප, ජනවාරි 21, පිටු. 8.

එකම කතුවරයාගේ ග්‍රන්ථ කීපයක් ඇති විට එම ග්‍රන්ථ මුද්‍රණය කළ වර්ෂයට අනුව පිළිවෙළින් ඇතුලත් කරන්න.

රණවීර පී (1997) .............................
රණවීර පී. (1999) .............................
රණවීර පී. (2002) ..............................

එකම කතුවරයා විසින් එකම වසරක ග්‍රන්ථ කීපයක් පළකර ඇතිවිට a, b, c යන අක්ෂර අදාළ වර්ෂයට පසුව යොදන්න.

උදාඃ සුරවිමල. ජේ. (2001a) ...............................
සුරවිමල. ජේ. (2001b) ...............................
සුරවිමල. ජේ. (2001c) ...............................

**විද්‍යුත් තොරතුරු ආශ්‍රය කරගත් විට,**

කතෘ නාමය (වර්ෂය), ඔහුගේ ලිපියේ නම, සඟරාවේ නම, ප්‍රකාශක, බ්‍රව්සරය(යටින් ඉරක් අඳින්න), එය කියැවූ හෝ තොරතුරු ලබාගත් දිනය.
උදා ඃ මුද්‍රණය නොකළ ආශ්‍රිත නිබන්ධ ආදිය

කතෘ (වර්ෂය) ග්‍රන්ථ හෝ ලිපි නාමය, ආයතනය හෝ එය ලබාගත් ස්ථානය, වරහන් තුළ (ප්‍රකාශයට පත් නොවූ) යන්න

උදාඃ සරණපාල. කේ. (2002) වන්නි උපභාෂාවේ වාග්කෝෂය, වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය (ප්‍රකාශයට පත්නොවූ).

ආකෘතිය
පිටු ගණන: පහත දක්වෙන ප්‍රමාණවලට අනුව ***පටුන, උපකාරානුස්මෘතිය, සාරසංග්‍රහය සහ ඇමිණුම් හැර*** පිටු 90 (වචන 20000) හෝ ඊට වැඩි විය යුතුය.
වැදගත්: 1. කඩදාසිවල ප්‍රමාණය ඃ 4A
2. අකුරු ප්‍රමාණය (Font size) ඃ 12,
අකුරු රටාව (Font) ඃ ඉතා පැහැදිලි, තියුණු, තද කළු නොවන අකුරු මෝස්තරයක් යොදාගන්න. උදාඃ FM Abhaya,
3. පේළි දෙකක් අතර පරතරය 1.5
4. පිටුවේ වට ප්‍රමාණයන් (හිස් අවකාශය සඳහා තැබිය යුතු ඉඩ)
උඩ කොටසඃ 2.0 cm දකුණු පැත්තඃ 2.5cm
යට කොටසඃ 2.5 cm වම් පැත්තඃ 4.0cm




පොත බැඳීම

1. කවරය

ප්‍රථම වරට නිබන්ධය භාර දීමේ දී ස්පයිරල් ක්‍රමය spiral binding භාවිතා කොට නිබන්ධය බැඳීම අවශ්‍ය වන අතර වාචික පරීක්ෂණයට මුහුණ පෑමෙන් පසුව සිදුවන සංශෝධන සකස් කිරීමෙන් පසුව කවරය නැවත වරක් තද දුඹුරු වර්ණය ඇති රෙක්සින් යොදා ගනිමින් පිටකවරය සකස් කොට පොත බැඳිය යුතුය.

මුල් කවරය.

නිබන්ධ නාමය, අනුමාතෘකාව සමග පිට කවරයේ උඩ කොටසේ සටහන් කළ යුතුය. අනුමාතෘකාව ප්‍රධාන මාතෘකාව සඳහා යොදාගත් අක්ෂරවල ප්‍රමාණයට වඩා කුඩා ප්‍රමාණයේ අක්ෂරවලින් (ගැලපෙන සේ) මුද්‍රණය කළ යුතුය. පිටුවේ මැද අපේක්ෂකයාගේ මුලකුරු සමග නම ඇතුළත් කළ යුතුය. පහත කොටසෙහි අධ්‍යයන අංශයේ නම, විශ්වවිiාලයේ නම සහ අධ්‍යයන වර්ෂය ඇතුළත් කළ යුතුය

පොතේ නාරටියඃ මිලි මීටර් 0.5ක වටප්‍රමාණයක් ඉඩ තබා නිබන්ධයේ ප්‍රධාන මාතෘකාව, අපේක්ෂකයාගේ කෙටි නාමය, උපාධි නාමය, වර්ෂය, විශ්වවිiාලය, අධ්‍යයන අංශයේ කෙටි නාමය මුද්‍රණය කරන්න.

*(මෙය නියම පරිමාණයට නොවේ. ආදර්ශ සටහනක් පමණි )*

දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේදී
මතුවන ගැටලු

MA
2013
UKLIN

වාග්විද්‍යාව ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ නිබන්ධය

දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේදී
මතුවන ගැටලු

ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන් පිළිබඳ වූ විශේෂ පර්යේෂණයකි

කේ. එච්. එම්. ජයතිලක

වාග්විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
2013
FGS/LING/MA/12/ xxx

නිබන්ධ භාර දීමේ අවසාන දිනය 31 . 12 . 2013

නිබන්ධය භාරදීමේ දී උපදේශකවරයාගේ අනුමැතිය ලබාගැනීම අත්‍යවශ්‍ය වේ.

*[Thesis Writing (MA) 2008 - SINHALA MED]*